# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1104/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 05/07/2024 පැය 1435

**මාධ්‍ය නිවේදනය**

**නන්දාරාම විහාරස්ථානයේ මිහිඳු මහ පෙරහැර හේතුවෙන් ප්‍රධාන මාර්ගය වෙනුවට විකල්ප මාර්ග භාවිතා කිරීම සම්බන්ධව - යටියන්තොට පොලිස් වසම.**

යටියන්තොට පොලිස් වසමේ නන්දාරාම විහාරස්ථානය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන මිහිඳු මහා පෙරහර 2024.07.06 වන දින අති උත්කර්ෂවත් අන්දමින් විථි සංචාරය කිරීමට නියමිතව ඇත.

ඒ අනුව මෙම පෙරහර 2024.07.06 වන දින රාත්‍රී 0800 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා කාලය තුල විහාරස්ථානයෙන් ආරම්භ වී විහාර මාවත ඔස්සේ පැමිණ බුදු මැදුර හන්දියෙන් හැටන් - කොළඹ ප්‍රධාන මාර්ගයට පිවිස අවිස්සාවේල්ල දෙසට මීටර් 500 ක් පමණ දුර ගමන් කර සමන්දේව ප්‍රථිමාව අසලින් දකුණට ඇති ෆැන්සිස් පෙරේරා මාවත ඔස්සේ නැවත විහාරස්ථානයට පැමිණීමට නියමිතව ඇත.

එම කාලය තුල හැටන් - කොළඹ මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන් පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

- හැටන් දෙස සිට අවිස්සාවේල්ල දෙසට ගමන් කරන වාහන සඳහා යටියන්තොට නවට හංදියෙන් දකුණට ඇති පරුස්සැල්ල, පනාපිටිය මාර්ගයේ වරාවල හංදිය දක්වා ගමන්කර, වරාවල හන්දියෙන් වමට ඇති කෑගල්ල අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයේ කරවනැල්ලට ගමන් කර දකුණට හැරී ප්‍රධාන මාර්ගයේ අවිස්සාවේල්ල දෙසට ගමන් කළ හැක.

- කොළඹ දෙස සිට හැටන් දෙසට ගමන් කරන වාහන සඳහා කරවනැල්ල හංදියෙන් වමට ඇති කෑගල්ල අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයේ වරාවල හංදියට ගමන් කර දකුණට බුලත්කොහුපිටිය මාර්ගයේ පනාපිටිය හංදියෙන් දකුණට හැරී හපුගම්මන, පරුස්සැල්ල මාර්ගයේ මාර්ගයේ නවට හංදිය දක්වා ගමන් කර ප්‍රධාන මාර්ගයට පිවිස වමට හැරී හැටන් දක්වා ගමන් කල හැක.

ඉහත නිවේදනය මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**